# මෙදා නත්තල් බැති ගී ගයමු අපි තලවිල පල්ලියේ....



දාහේ වැටෙනා ගිණි අවුවේ
පා රත් වෙන වැලි කතරේ
ගමන් මලුද කරේ තියන්
අපි යනවා නුග සෙවණ ට
තලවිල ආනා මවුනී

වන්දනා ගමනා යෑම සඳහා මිනිසා තුළ ඇති පෙළඹීම සෑම මනුෂ්‍යයෙකුටම ස්වභාවයෙන්ම ආ ලක්ෂණයකි. මිනිසාගේ ඇදහිල්ල කුමක් වුව ද මිනිසා දුරකතර ගෙවා වනදුර්ග ජල දුර්ග ගිරි දුර්ග පසු කරමින් නොයෙකුත් අතුරු ආන්තරා වලට මුහණ දෙමින් තමන් අදහන ආගම් වලට අනුව තමුන්ට ආවේනික පූජාස්ථාන කරා ගිය බව ඉතිහාසය පුරා අපට දැකගත හැකි ය.



ශ්‍රද්ධ වූ බයිබලයේ ද වන්දනා ගමන් පිළිබඳව සඳහන් වන අවස්ථා අපට නොයෙක් විට මුණගැසෙයි. ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනයට පසුව ශුද්ධ වූ දේශයක් කරා වේවා ලොවේ ඇති වන්දනා ස්ථාන කරා වේවා කිතුණු වන්දනා ගමන් නොකඩවා පැවතුණ බවට ශාක්ෂි ඇත. විවිධාකාර අපහසුතා හා දුෂ්කරතා මධ්‍යයේ වුව ද බැතිමතුන් වන්දනා ගමන් වල යෙදුනේ ශ්‍රද්ධාශීල වර්ධනයේ මාර්ගයෙන් දෙවිඳුන්ට වඩා සමීපවීමට ඇති ආශාව නිසා යයි සිතිය හැකි ය. සාමාන්‍ය ජනතාව කොයි කවුරුත් පාහේ නිරතුරුව උත්සාහ දරන්නේ දුරස්තරව වෙසෙන දෙවියන් වෙතට ළඟාවීමටයි. එබැවින් මෙවර නත්තල් උත්සවයට ගැයෙන බැති ගී තලවිල පල්ලියට යන අයුරු සිහිගන්වමින් සැළසුම් කළේ මේ බව නැවත මතක් කර දීමටයි. තලවිල පල්ලියට නන් දෙසින් බැතිමතුන් පැමිණෙන්නේ ඇයි? මෙයට මූලික හේතුව වන්නේ ඉතිහා-සයේ සඳහන් වන පරිදි මෙහි ඇති සුවිශේසී වූ කාරණා නිසා ය.

ඉතිහාසයේ සඳහන් වන පරිදි තලවිල පල්ලිය ගොඩ නැගුණේ මේ ආක-ාරයෙනි. එදා තලවිල වෙරළ ආසන්නයේ දී යුරෝපියන් ගමන් ගත් නැවක් මුහුදුබත් විය. එහි සිටි යුරෝපීය නැවියන් තමන්ගේ ජීවිත බේරා දෙන ලෙස ඉල්ලා ශාන්ත ආනා මෑණියන්ට බාරයක් විය. ඒ වන විට ශාන්ත ආනා මෑණියන්ගේ පිළිරුවක් ඒ ස්ථානයේ තිබිණ. නැවියන්ගේ ජීවිත බේරීම නිසා එයට ප්‍රතිචාර වශයෙන් ශාන්ත. ආනා මෑණියන් වෙනුවෙන් කුඩා දෙව් මැදුරක් තලවිල වෙරළ ආසන්නයේ ඉදිකෙරුණි. එය දේව අභිප්‍රාය ඉටු වීමක් ලෙස කිත-ණුවෝ සළකති.

එදා සිට තලවිල පල්ලිය දැක ගැනීමටත් එය වැඳ නමස්කාර කර ගැනීමටත් නන් දෙසින් පිරිස් පැමිණෙන්නට විය. අතීතයේ දී ප්‍රවාහන පහසුකම් නොමැති වුව ද පයින් සහ ගොන් බැඳි කරත්ත වලින් තලවිලට බැතිමතුන් පැමිණිය හ. දැන් ද අතීතය සිහිගන්වමින් කොතෙකුත් ප්‍රවාහන පහසුකම් තිබුණත් සමහර වන්දනා කරුවන් කරත්ත වලින් තලවිලට පැමිණෙනු දැකිය හැකි ය. 1862 වන විට වන්දනාකරුවන් 25000 ත් 30000 ත් අතර ප්‍රමාණයක් රැසුවුණ බව පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති ගැසට් පත්‍රයේ සඳහන් වේ. කෙසේ වුව ද එම ස්ථානයේ ආනාතුමියගේ ශුද්ධ වූ ධාතු කිසිවක් නොමැති කම මහත් අඩුවක් බව යාපනයේ සෙමේරියා රදගුරුතුමා වතිකානුවට දන්වා ශුද්ධ වූ ධාතු කීපයක් ලබාගැනීමට උත්සාහ දැරුවද එය ව්‍යවර්ථ විය. නමුත් 1870 දී වතිකානුවට ගිය රදගුරු පදවිය හෙබවූ බොන්ජන් රදගුරුතුමාට ශුද්ධ වූ ධාතු ලබාගැනීමට හැකි විය. මේවා 1872 වර්ෂයේදී එවකට සිද්ධස්ථානයේ පාලකව සිටි එෆ් එම් ජේ ගොරේ පියතුමාට බාර දෙන ලදී.. ධාතු වශයෙන් ආනා තුමියගේ අස්ථි ධාතුවෙන් කැබැල්ලක්ද ප්‍රාණ පරිත්‍යාගී වූ ශුද්ධ වූ ඇග්නස් කණ්‍යාවගේ ද ශුද්ධ වූ සිල්වියා විධවිය ගේ ද පස්සිහි මරියා මදලේනා කණ්‍යාවගේ ද ශුද්ධ වූ වස්තු සිද්ධස්ථානයේ ඇති ශුද්ධ වූ කරඬුවේ තැන්පත්කර ඇති බව විශ්වාස කෙරෙයි.

ලෝ පුරා ඇති ශුද්ධ වූ ආනා තුමියගේ සිද්ධස්ථාන වලට දෙන ප්‍රසාද අනුව තලවිල සිද්ධස්ථානය සඳහාද නමවන පියුස් පාප්තුමා තලවිල මංගල්‍යයට පැමිණ පූර්ණ වරප්‍රසාද ලබා දී ඇත.

එබැවින් තලවිල පුද භූමිය ආගම් බේධයකින් තොරව සැමටම ඓතිහාසික වටිනාකමක් ඇති තැනක් වනනේ ය.

අපේ මුත්තන් මී මුත්තන්
පා ගමනින් ආ විලසින්
අග්ගල මලු කරේ තියන්
අපි යනවා නුග සෙවණේ
මේ නත්තල ගත කරන්න
තලවිල ආනා මවුනී

*මෙවර කතෝලික සභාව මෙහෙයවන නත්තල් බැති ගී වැඩ සටහන දෙසැම්බර් දෙවන දා පස්වරු 6 ට හැම්ප්ටන්පාක් ආතවර්න් (Artheurwren) කොමියුනිටි ශාලාවේ දී (Melway 96F 8)*

මෙවර කතෝලික සභාව විසින් තලවිල පල්ලිය අරමුණු කොට ගෙන පවත්වනු ලබන නත්තල් බැති ගී වැඩ සටහන ඔබ සැමට අපූර්ව අත්දැකීමක් වනු ඇත. දෙසැම්බර් දෙවන දා පස්වරු 6 ට හැම්ප්ටන්පාක් ආතවර්න් (Artheurwren) කොමියුනිටි ශාලාවේ දී උත්කර්ශවත් අයුරින් පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. එදිනට නත්තල් බැති ගී වලට අමතරව කුඩා ළමුන් වෙනුවෙන් නත්තල් සීයා ද පැමිණෙන අතර සහභාගිවන සියලු දෙනාටම සංග්‍රහයක්ද පැවැත්වෙනු ඇත. ඔබ වසර කීපයකින් තලවිල පල්ලියට නොගියද ඔස්ට්‍රේලියාවේ සිටියත් මෙදිනදී තලවිල පල්ලියට ගිය අයුරු සිහිපත් කරගන්නට ඔබට මේ උත්කර්ශවත් අවස්ථාවේ හැකි වනු ඇත. ශ්‍රී ලාංකික සැමට සහභාගිවන ලෙස කතෝලික සංගමය ගෞරවයෙන් ආරාධනා කරයි.

නුග සෙවණේ වාඩි අරන්
ඔබෙ පිලිරුව දෙස බලමින්
දේව පුතුන් මෙලොව වැඩිය
ඒ අසිරිය අපි ගයන්නෙ
ලබා දෙන්න දේව පිහිට
තලවිල ආනා මවුනී

එදින ඔබට තලවිල ශාන්ත ආනා මෑණියන් සිහිපත් කරමින් ගැයෙන මෙවැනි බැති ගී අසා රසවිඳින්නට හැකි වනු ඇත.

ශ්‍රීනාත් මද්දුමගේ

## වෙලාවක් නෑ

නෑ මිතුරන් මුණ ගැහෙන්නෙ නෑ
ගමනක් බිමනක් යන්නෙත් නෑ
පොතක් පතක් කියවන්නෙත් නෑ
කොහෙද අනේ මට වෙලාව නෑ

ලියන්ට නම් දේවල් එමටයි
තැපැලටත් සුළු මුදලක් යයි
ගාන සැර වුනත් කෝල් කරන්නේ
ඊට වෙලාවක් නැති හින්දයි

ගමේ ඉන්න කොට දෙණියෙ ලිඳෙන්
නාලා රෙදි හෝදන් ආවා
වෙල් එළියෙන් නෙළු පලා ටිකත්
නෙරියෙ කොණක දවටන් ආවා

දර පොල් කොළ වත්තෙන් අහුලා
ඉවුම් පිහුම් ටික කර ගත්තා
තුනපහ ටික දැතින් අඹරා
කටට රහට කෑමත් කෑවා

අළුයම වැඩපල අහවර වී
රටා දමා ගෙම්දුල මැද්දා
හැතැප්ම දෙක තුන පයින් ගිහින්
ඕනෑ එපාකම් කර ගත්තා

මේ සේරම මැද වාසිටියේ
විබාගයත් හරියට කෙරුවා
උස පුටුවක හිඳ අත මිට සරුකල
රැකියාවක වරමත් ලැබුවා

මොකක්ද පෙර කල පවක් තිබී
පිටරට සැප හීනෙන් දුටුවා
දුවන මුවන් දැක නෙළු පලා
විසි කොට පර දේසෙට ආවා

බොරළු ගොඩේ දූව පැනපු දෙපා
කාපට් සැපයට පුරුදු වුනා
සීතල උණුසුම ඕනෑ හැටියට
අඩු වැඩි වෙන මීටර ඇතුවා

වතුර මලෙන් ඇඟපත දෙවෙනා
මැසිමෙන් රෙදි ටික හේදෙන්නා
කාර් එකෙන් ගෙට ගෙයින් කාරෙකට
එත් විවේකය ඇත්තෙම නෑ

පැකට් කරපු තුන පහ දාලා
සුමානෙකට සෑහෙන්න උයා
අයිස් පෙට්ටියේ අඩුක් කලත්
වෙන දේකට මට වෙලාව නෑ

**ශ්‍රියා කුමාරසිංහ**
නවසීලන්තය

